22

ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා දායකත්වය

අරාබිය හා ශ්‍රී ලංකාව අතර පැවති සබඳතා

ශ්‍රී ලංකාවේ පිහිටීම, අරාබි ජාතිකයන්ගේ නාවුක ගමනාගමන පිළිබඳ දැනුම හා අත්දැකීම් ඔවුන්ට ක්‍රිස්තු වර්ෂ ආරම්භයට ප්‍රථම ක්‍රිස්තු පූර්ව යුගයේ සිට ම ශ්‍රී ලංකාව හා සම්බන්ධතා පැවැත්වීමට හේතු කාරක වී ඇත්තේ ය.

අරාබි ව්‍යාපාරිකයන් හා ශ්‍රී ලංකාව අතර සබඳතා කුමන කාලයක සිට ආරම්භ වුණි ද යන්න නිශ්චිත වශයෙන් ම ගණන් බලා පැවසිය නොහැකි වුව ද පුරාණයේ සිට ම මෙම සබඳතා පැවත එන බව දැන ගැනීමට ඓතිහාසික සාක්කි සහය වේ.

ඉස්ලාම් දහම ලොවට පහළවීමට පෙර සිට ම අරාබි ව්‍යාපාරිකයෝ ඉන්දියානු සාගරය ආශ්‍රිත ව්‍යාපාරවල නියැළුණහ. නැගෙනහිර හා බටහිර රටවල් අතර ව්‍යාපාර ද්‍රව්‍ය හුවමාරු කිරීමෙහි ලා පුරෝගාමීන් ලෙස ක්‍රියා කළ මොවුහු ශ්‍රී ලංකාව පිළිබඳ ව ද දැන සිටියහ. එවකට නැගෙනහිර හා බටහිර යා කළ සේද මාවත මධ්‍යයේ ශ්‍රී ලංකාව පිහිටි බැවින් අරාබිවරුන්ගේ ව්‍යාපාරික ගමනාගමන කටයුතුවල දී ශ්‍රී ලංකාව හොඳ නවාතැනක් විය.

ශ්‍රී ලංකාවේ පිහිටි වරාය තුළ දැක්නට ලැබුණු වෙළඳ භාණ්ඩ, ආරක්ෂක පහසුකම්, ආහාර, පානීය ජලය හා නැවු අලුත්වැඩියා කිරීමේ පහසුකම් ආදිය අරාබි ව්‍යාපාරිකයන් මෙහි නවාතැන් ගෙන යෑමට හේතු වුණි.

මෙසේ අරාබි ජාතිකයන් අතීතයේ සිට ම ඉන්දියානු සාගරයේ නිතර යාත්‍රා කිරීමටත් පුරුදු වී සිටියා පමණක් නොව ඔවුහු දකුණු ආසියාවේ සහ අග්නිදිග ආසියානු ප්‍රදේශවල කුඩා ජනාවාස පිහිටුවා ගැනීමට ද උනන්දු වූහ.

ක්‍රි. පූ. 310ට පෙර තරම් දීර්ඝ කාලයක සිට ම ඔවුන් මැඩගස්කරය සහ සුමාත්‍රාව අතර වෙළෙඳ කටයුතු කරගෙන යද්දී ශ්‍රී ලංකාව අතර මැදි කලාපයක් ලෙස සලකා කටයුතු කර තිබීම ද වැදගත් ය. මලබාර් වෙරළේ සහ ශ්‍රී ලංකාවේ සිටින අරාබීන් වෙරළ ආශ්‍රිත කටයුතුවල ප්‍රවීණයන් ලෙස සැලකුම් ලබා සිටි බව ද ප්ලිනි (ක්‍රි. ව. 23-79) සඳහන් කරයි.

ටොලමි (ක්‍රි. ව. 150) තම සිතියම අනුසාරයෙන් කරන පැහැදිලි කිරීම්වලට අනුව ඔහු මෙම කුඩා දිවයින පිළිබඳ මුල්වරට දැනුමක් ලබාගෙන ඇත්තේ ද සාමුද්‍රික කටයුතුවල යෙදුණු අරාබීන්ගෙනි. එහෙත් ප්ලිනි පෙන්වා දෙනුයේ මලබාර් ප්‍රාදේශයේ අරාබි ජාතිකයන් විශාල සංඛ්‍යාවක් වාසය කළ ද ශ්‍රී ලංකාවේ එතරම් බහුතරයක් නොවූ බව ය.

ඉහත සඳහන් කරන ලද ප්‍රකාශ සියල්ල ම අරාබිය හා ශ්‍රී ලංකාව අතර පැවත ආ සබඳතාවල ඉපැරණි බව හා ඒ සබඳතා ඉස්ලාම් දහම බිහිවීමටත් පෙර සිට ම පැමිණෙන්නෙකි, යන්න නිරූපණය කරයි. ඒ සමග ම ඉස්ලාමයේ පැමිණීමත් සමග මෙම සබැඳියාව තවත් සිථිර විය.

ඉස්ලාමය ශ්‍රී ලංකාව තුළ හඳුන්වාදීම

ශ්‍රී ලංකාවට ඉස්ලාම් කෙදිනක හඳුන්වාදෙනු ලැබුවේ ද යන්න පිළබඳ පැහැදිලි සාක්කි දක්නට නොලැබුණ ද ඉස්ලාම් හඳුන්වා ගැනීමට හේතු වූ මූලාශ්‍රගත සාක්කි විශාල ප්‍රමාණයක් ලැබී ඇත. මේවායේ සහය ඇති ව අප රටට ඉස්ලාම් හඳුන්වා දුන් කාල පරිච්ඡේදය පහත සඳහන් පරිදි අනුමාන කළ හැකි ය.

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා තම අවසාන කාල පරිච්ඡේදය තුළ රටවල් රැසකට ඉස්ලාමීය ධර්ම දූත පණිවුඩ යැවුහ. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා යවන ලද ලිපි මෙයට සාක්කි වේ. මෙලෙස ම නැගෙනහිර රටවල්වලට ද නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා විසින් ලිපි යවන ලද බවට ඉතිහාසඥයන් කරුණු ඉදිරිපත් කර ඇත.

වහබ් ඉබ්නු අබි හෆ්සා නමැති නබි මිතුරා චීනයට ගිය බව තෝමස් ඔර්නල්ට් නැමැත්තා සඳහන් කළ බව හමීදුල්ලාහ් තම Foreign Relations of The Prophet Mohammed යන ග්‍රන්ථයේ සඳහන් කරයි. එය සාක්කියක් ලෙස ගෙන M.C සිද්දි ලෙබ්බේ මුස්ලිම් නේෂන් සඟරාව මගින් පහත අදහස ඉදිරිපත් කරයි.

ක්‍රි. ව. 628 දී වහබ් ඉබ්නු අබි හෆ්සා නැමැති නබි මිතුරාව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ශ්‍රී ලංකාවේ රජතුමා හමුවීමට එවූහ. නබිතුමාගේ ලිපිය රජතුමාට පිරිනැමූ නබි මිතුරාට තම සේවාව දියත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදි. ඔහු ක්‍රි. ව. 632 දී තම මවු රට බලා පිටත් වූයේ ය.

මෙම සාක්කි දෙක ම නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දෙන ලදි, යන්නට සාධක ලෙසට ප්‍රමාණවත් ය.

කලීෆා උමර් රළියල්ලාහු අන්හු තුමාගේ කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දෙන ලදි, යැයි උපකල්පනය කිරීමට ඉතිහාසඥවරයකු වූ ඉබ්නු සහ්රායාර් තම "අජාඉබුල් හින්ද්" නම් ග්‍රන්ථයේ සඳහන් කරන ලද සිදුවීම සහාය වේ.

එවකට ශ්‍රී ලංකාවේ ජීවත් වූ අරාබිවරු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා පිළිබඳ සැල වූ වහා ම ඒ පිළබඳ නිවැරදි තොරතුරක් දැන ගැනීමේ අරමුණින් තමන් අතර සිටි දක්ෂයකු තෝරාගෙන ඔහුට සහයකු ලෙස තවත් කෙනකු ඔහු සමග යැවූහ. මෙම දූතයන් අරාබියට ගොස් ළඟා වන විට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා වෆාත් වී එතුමාට පසු කලීෆාතුමා ද මිය ගොස් දෙවන කලීෆා රාජ්‍ය පාලනය පැවතුණි. උමර් රළියල්ලාහු අන්හු තුමාගෙන් ඉස්ලාමය පිළබඳ විමසා දැනගත් ඔවුහු නැවත ශ්‍රී ලංකාවට පැමිණියහ. පැමිණෙන අතරමග දී, පාකිස්තානයේ මක්‍රාන් තැන්නේ දී ඔහු මිය ගියේ ය. ඔහු සමග ගිය සේවකයා ශ්‍රී ලංකාවට පැමිණ ඉස්ලාමය පිළිබඳ තොරතුරු දැනුම් දුන්නේ ය.

ක්‍රි. ව. 8 වන සියවසේ දී උමෙයා කලීෆාවරයෙකු වූ අබ්දුල්මලික් හා වලීද් යන අයගේ පාලන කාලයේ දී ඉරාකයේ ආණ්ඩුකාර හජ්ජාජ්ගේ හිරිහැරවලට බිය වී උමෙයා වංශයේ රාජ්‍යයට විරුද්ධ බනූ හාසිම්වරුන් දකුණු ආසියාවේ හා ශ්‍රී ලංකාවේ වෙරළ අවට පදිංචි වූ බවට තොරතුරු "සිලෝන්" නම් ග්‍රන්ථයේ සර් ජේම්ස් එමර්සන් ඩෙනන්ට් සඳහන් කර ඇත. මෙලෙස ම සිදු වූ තවත් පදිංචිවීමේ සිදුවීමක් ඉතිහාසඥයකු වූ අල්බලාදූරි තම "ෆුතුහුල් බුල්දාන්" නම් ග්‍රන්ථයේ පහත දැක්වෙන පරිදි සඳහන් කළේ ය.

ක්‍රි. ව. 8 වන සියවසේ ආරම්භක කාලයේ දී එවකට ශ්‍රී ලංකාවේ රජතුමා වූ දෙවන ධාථෝපතිස්ස ශ්‍රී ලංකාවේ මියගිය අරාබි වෙළෙඳුන් කිහිපදෙනකුගේ වැන්දඹුවන් හා අනාථ දරුවන් අරාබියට යැව්වේ ය. මොවුන් ගිය නැව වර්තමාන කරච්චියට සමීප ව පිහිටි තේබල් නම් ස්ථානයේ දී කොල්ලකරුවන් විසින් අත්පත් කර ගෙන සිරගත කරන ලදි. මෙම සිදුවීම සැල වූ වහා ම හජ්හාජ් සින්දු රටේ රජතුමා වූ රෝයි දහර්ට ලියුමක් යවා එම කාන්තාවන් විගසින් නිදහස් කරන ලෙස පැවසුවේ ය. හජ්ජාජ්ගේ ආයාචනය පිළිබඳ උදාසීනව කටයුතු කළ බැවින් සින්දු රටට මුහුම්මද් බින් කාසිම්ගේ නායකත්වය යටතේ විශාල සේනාවක් යවා ක්‍රි. ව. 715 දී සින්දු ප්‍රදේශය මුස්ලිම්වරු විසින් ජයග්‍රහණය කළ හ.

ඉහත සඳහන් කළ සිදුවිම් සියල්ල ම ඉස්ලාමය ව්‍යාප්ත වූ කාලයේ ශ්‍රී ලංකාව තුළ ද ඉස්ලාම් හඳුන්වා දී තිබුණි, යන්න නිරූපණය කිරීමට අවශ්‍ය සාධක ලෙස දක්නට ලැබේ. ඉන්පසු ද දිගින් දිගට ම එනම්, හිජ්රි 2 වන හා 3 වන සියවස්වල දී ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් ජීවත් වුණු බව අරාබි කාසි සනාථ කරයි. ශ්‍රී ලංකාවේ දී සොයා ගන්නා ලද සොහොන් ගල්, ගල්කුලුනු ද මේ බව තහවුරු කරයි. ඉස්ලාම් හැඳිනගත් බව ඉතිහාසයේ සඳහන් වෙන කාලිද් ඉබ්නු බකායාවේ හිජ්රි 337දී තැන්පත් කරන ලද සොහොන් ගල ක්‍රි. ව. 1787 දී ශ්‍රී ලංකාවෙන් සොයා ගන්නා ලදි. ඉස්ලාමය දේශනා කිරීම සඳහා බැග්ඩැඩ් කාලීෆාවරයා විසින් මොහු ශ්‍රී ලංකාවට එවන ලදි.

ආරම්භයේ දී අරාබිවරුන් ද පසුව අරාබි මුස්ලිම්වරුන් ද ශ්‍රී ලංකාවට පැමිණ ව්‍යාපාරික කටයුතුවල නියැළුණු විට ද මෙහි පදිංචි වූ විට ද ලාංකීය රජවරු හා ජනතාව ඔවුන් පිළිගෙන සංග්‍රහ කළහ. මෙලෙස මොවුන් ආනයනය අපනයනයට පහසු වන ලෙස වෙරළාසන්න ව වාසස්ථාන හා ගබඩා පිහිටුවා ගත්හ.

ලාංකීය රජවරුන්ට හා ජනයාට අවශ්‍ය විදේශ භාණ්ඩ එම රටවල්වලින් ගෙනවිත් දෙන ලද්දේ බොහෝවිට අරාබි මුස්ලිම්වරුන් ය. එතැනින් අහවර නොවී දේශීය නිෂ්පාදන භාණ්ඩ අන්තර් ජාතික වෙළඳ පොළට ගෙන ගොස් භාණ්ඩ හා රට අන්තර් ජතික මට්ටමින් හඳුන්වා දුන්හ.

තව ද ඔවුන් ස්වදේශීය රජවරුන් සමග හා ජනතාව සමග සදාචාරාත්මක ලෙස හැසිරුණහ. ශ්‍රී ලංකාවට පැමිණි අරාබිවරුන්ට ශ්‍රී ලංකාව ආක්‍රමණය කිරීමේ සිතුවිල්ලක් හෝ මෙහි ඇති සම්පත් සූරාගැනීමේ අරමුණක් කිසි දු ආකාරයකින් නොතිබුණි. මේ නිසා ඔවුන්ට නුපුරුදු සංස්කෘතික සම්ප්‍රදායන්වලින් යුක්ත ස්වදේශ ජනයා සමග සෙනෙහසින් ජීවත්වීමට එතරම් අපහසු නොවී ය.

මුල් කාලයේ දී මුස්ලිම්වරුන් තුළ දක්නට ලැබුණු මෙවැනි යහගුණාංග හේතුවෙන් ඔවුහු ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳාමේ තනි අයිතිය ලබා සිටි අතර වෙළෙඳාම සම්බන්ධ ව කරුණු කාරණා පිළිබඳ රාජ්‍ය පාලකායට උපදෙස් ලබාදෙන්නන් ලෙස ද සිටියහ.

ඔවුහු තමන් ජීවත් වූ රට වෙනුවෙන් සිදු කළ සේවා උදෙසා මොවුන් වෙනුවෙන් තනි ජනාවාස සඳහා ප්‍රදේශ ලබා දුන් අතර ස්වදේශ කාන්තාවන් විවාහ කර දීමට තරම් ස්වදේශිකයන්ගේ සිත් මුස්ලිම්වරු ජය ගත්හ. සිංහල රජවරු රාජ්‍ය තුළ මොවුන්ට මන්ත්‍රී, දූතයන් යන උසස් පදවි තානාන්තර ලබා දුන්හ.

මෙම කාලයේ දී ඉස්ලාමීය කිලාෆතය පවා ලාංකීය මුස්ල්ම්වරු පිළබඳ අවධානය යොමු කරමින් තිබුණි. අබ්බාසීය රාජ්‍ය පාලන සමයේ දී ලාංකීය මුස්ලම්වරුන්ගේ අධ්‍යාපනය, ආගම, සදාචාරය ඇතුළු අංශයන්හි දුර්වලතා ඇති වූ විට එවකට පාලනයේ සිටි අබ්බාසීය පාලකයකු, කාලිද් ඉබ්නු බකායා නමැති උපදේශකවරයා කොළඹට එව්වේ ය. ඔහු කොළඹ නගරයේ ආගමික සේවා ඉටු කළේ ය. ඔහුගේ සිහිවටනයක් බ්‍රිතාන්‍ය පාලන කාලයේ දී සොයා ගන්නා ලදි.

ශ්‍රී ලංකා මුස්ලිම් ජාතිකයන් ආරම්භයේ දී කොළඹ, බේරුවල, ගාල්ල, මාතර වැනි වෙරළබඩ නගරවල හා ඉන්පසු ක්‍රම ක්‍රමයෙන් කුරුණෑගල, ගම්පොළ වැනි කඳුකර ප්‍රදේශවල ද පදිංචි වී ජීවත් වී ඇත. ඔවුන්ගේ පරම්පරාව අද අප රටේ විවිධ ප්‍රදේශවල ව්‍යාප්තව ජීවත් වන මුස්ලිම් ප්‍රජාව ලෙස සැලකිය හැකි ය.

දේශීය යහපතට දැක්වූ දායකත්වය

ලාංකීය මුස්ලිම්වරු තමන්ගේ අභිවෘද්ධිය සඳහා පමණක් නොව තම රටේ දේශිය යහපත උදෙසා ද බොහෝ සේ දායක වූහ. ශ්‍රී ලංකාවේ මැණික් ගල්, ඇත් දළ, සුවඳ විලවුන් යනාදිය විදේශ රටවලට ගෙන ගියහ. "ආදම් අලෛහිස්සලාම් තුමාගේ පාදය සලකුණු වූ කන්ද ශ්‍රී ලංකාවේ පිහිටා ඇත." යන්න විශ්වාස කළ අරාබි ව්‍යාපාරිකයන්ගේ හා වරින්වර ශ්‍රී ලංකාව නැරඹීමට පැමිණි අරාබි යාත්‍රිකයන්ගේ චාරිකා මගින් ද මෙරට ප්‍රචලිත විය.

ශ්‍රී ලංකාවේ ආර්ථික අභිවෘද්ධිය උදෙසා මුස්ලිම්වරුන්ගේ දායකත්වය විශේෂිත ය. ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ විදෙස් රටවලට අපනයනය කර විදේශ විනිමය උපයා ගැනීමට, මුස්ලිම්වරු ද වැඩි දායකත්වයක් ලබා දුන්හ. එවැනි අපනයන භාණ්ඩ නිෂ්පාදනය කිරීමට ජනතාව ආරම්භ කිරීම නිසා රටේ ආදායම ඉහළ ගියේ ය. වෙළඳාමෙහි පමණක් නොව රටේ ගොවිතැන නගාසිටුවීමට ද මුස්ලිම්වරු වෙහෙස වූහ. අස්වැන්න වැඩි කිරීමේ අරමුණින් තමන් ද ගොවිතැනෙහි නියැළුණහ.

විදේශ රටවලින් පේෂ කාර්මිකයන් කැඳවාගෙන පැමිණ පේෂ කර්මාන්තය වර්ධනයට වෙහෙස වූහ. එහෙත් දක්නට ලැබුණු දේශීය ප්‍රවාහන ක්‍රමයට "තවලම්" නම් ප්‍රවාහන ක්‍රමය හඳුන්වා දී එය පාලනය කරමින් සිටියහ.

මෙරට දේශපාලනයට හා එහි දේශීය නිදහස ජය ගැනීමට මුස්ලිම්වරු නොමඳ දායකත්වයක් දක්වූහ. පොළොන්නරු රාජධානි සමයේ කීර්තිමත් රජකු වූ මහා පරාක්‍රම රජතුමාගේ (ක්‍රි. ව. 1156-1186) රාජ සභාවේ මුස්ලිම් ජාතිකයන් 4 දෙනකු ව්‍යාපාර උපදේශකවරු ලෙස පත් කර සිටි බව භූගෝල විද්‍යායකු වන ඉද්රීසිගේ සටහන මහාචාර්ය එස්. පරණවිතාන මහතා තහවුරු කරයි.

ඊජිප්තුව සමග ව්‍යාපාරික අවස්ථා වැඩි කර ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා රාජ්‍යය වෙළඳාමෙහි කොටස්කරුවෙකු වූ මුස්ලිම්වරයෙකුව ඊජිප්තුවට දූතයෙකු ලෙස යැව්වේ ය. පෘතුගීසීන් පලවා හැරීමේ අරමුණින් ගාලු කොටුවේ රජතුමා වූ සාමෝරින්ගේ උපකාර ලබා ගැනීම සඳහා මායාදුන්නේ රජතුමා දූතයෙකු ලෙස මුස්ලිම්වරයකු යැව්වේ ය. ගාලු කොටුවේ යුධ සේනාවේ උපකාර ලබා දීමෙන් පමණක් නොනැවතී තමන් ද සේනාවට බැඳී සටන් කළහ. නුවර රජතුමාගේ දූතයන් ලෙස ද මුස්ලිම්වරු සේවය කළහ.

ඉංග්‍රීසින්ගේ පාලන කාලයේ දී රටේ පාලන ක්ෂේත්‍රය තුළ ද සේවය කළහ. 19 වන සියවසේ අවසාන භාගයේ දී ශ්‍රී ලංකාවේ නිදහස වෙනුවෙන් අනෙකුත් ජාතීන් සමග එක් ව සටන් කළ මුස්ලිම්වරුන්ගේ දායකත්වය විශේෂිත ය.

බෙදා වෙන්කොට පාලනය කරන ප්‍රතිපත්ති රැගත් ඉංග්‍රීසින් ශ්‍රී ලංකීය සමාජය බෙදා වෙන් කිරීම තුළින් නිදහස ලබා දීම ප්‍රමාද කිරීමට උත්සාහ ගත්හ. එවිට අනෙකුත් ජාතික නායකයන් සමඟ එක් ව ටී. බී. ජයා ඇතුළු මුස්ලිම් නායකයන් හඬ නැගූ නිසා

නිදහස ලබාගැනිම පහසු විය. 1815 දී අහිමි වී ගිය ජාතික නිදහස නැවත 1948 දී ලබා ගැනීමේ කාර්යභාරයේ දී මුස්ලිම් නායකයන්ගේ ද දයකත්වය හිමි විය.

මේවාට අමතර ව සමාජයේ සමගිය, අධ්‍යාපන අභිවෘද්ධිය, නීති ක්ෂේත්‍රය, සෞඛ්‍යය අංශය, ජාත්‍යන්තර සම්බන්ධතා යනාදිය මෙරට සංවර්ධනයට හා දියුණුවට මුස්ලිම්වරුන් එදා ලබාදුන් දායකත්වය ද අද ලබාදෙන දායකත්වය ද අමතක කළ නොහැකි ය.

අභ්‍යාසය

1. ශ්‍රී ලංකාවේ ඉස්ලාම් දහම හඳුන්වා දීම සඳහා දයක වන්නේ කුමන ජාතිකයන් ද?
2. වෙළඳ කටයුතු උපදේශකවරුන් ලෙස මුස්ලිම් ජාතිකයින් 4 දෙනකු පත් කර තිබුණේ කුමන රජ සමයක ද?
3. මුස්ලිම්වරුන්ගේ මුතුන් මිත්තන් වෙරළබඩ තීරයේ ජනාවාස තනා ගැනීමට හේතු වූ පසුබිම විස්තර කරන්න.
4. ශ්‍රී ලංකවේ නිදහස වෙනුවෙන් සටන් කළ මුස්ලිම් නායකයන් සඳහන් කරන්න.
5. ශ්‍රී ලංකාවේ ආර්ථික අභිවෘද්ධිය වෙනුවෙන් මුස්ලිම්වරුන්ගේ දයකත්වය කෙසේ දැයි පැහැදිලි කරන්න.